Academic & Student Services Branch
අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශය

*Tel. No. - 045- 2280019*

Sabaragamuwa University of Sri Lanka
15 JAN 2021
DEAN'S OFFICE
Faculty of Agricultural Sciences

2021.01.13

පීඨාධිපති,
කෘෂි විද්‍යා පීඨය.

**ශිෂ්‍ය නේවාසිකාගාරවල නිරෝධායන අවශ්‍යතා සමග සිසුන් කැඳවා ගැනීම.**

උක්ත මාතෘකාව යටතේ ඔබ විසින් යොමු කරන ලද 2021.01.13 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව පහත පරිදි ඔබ පීඨයේ එකී අධ්‍යයන වර්ෂයට අදාළ දෙවන වසර නේවාසිකාගාර සඳහා ලියාපදිංචි වී සිටි සිසුන්ට පහත අයුරින් නේවාසිකාගාර පහසුකම් සපයා දිය හැකිය.

| | |
|---|---|
| පිරිමි සිසුන් | ඩිලානි, සංඝමිත්තා |
| කාන්තා සිසුන් | වලව A, B, C |

තවද නේවාසිකාගාර සඳහා පැමිණීමේදී හා පහසුකම් ලබා ගැනීමේදී පහත අවශ්‍යතාවයන් සපුරාලිය යුතුවේ.

- තමා දැනට නිරෝධායනය වෙමින් නොසිටින බව තහවුරු කළ ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන්/ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් ලිපිය ඉදිරිපත් කිරීම.
- ආහාර ලබාගැනීම සඳහා පිගානක්, කෝප්පයක් හා වතුර බෝතලයක් තමා වෙනුවෙන්ම රැගෙනවිත් තබාගැනීම.
- අදාළ නිරෝධායන දින 14 තුල එකිනෙකා භෞතිකව සමීපවීම, කණ්ඩායම් ගතවීම ආදිය සිදු නොකල යුතුය. (සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම)
- නේවාසිකාගාරයේ රැඳී සිටින කාලය තුල අඛණ්ඩව එහි සිටිය යුතු අතර වරින් වර තම නිවෙස් වෙත හෝ වෙනත් අවදානම් කලාපයන්හි සංචරණය කිරීමෙන් වැලකිය යුතුය.
- ශරීර උෂ්ණත්ව පරීක්ෂා කිරීම, අත් සේදීම සහ විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලබන සෞඛාරක්ෂිත ක්‍රම වලට අනුගත වීම.

ඒ අනුව ඉහත සෞඛාරක්ෂක පිළිවෙත් සඳහා අනුගතවේ නම් 2021.01.20 දින පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා කෘෂි විද්‍යා පීඨයේ දෙවන වසර (2017/2018) දෙවන සමාසිකයේ නේවාසිකාගාර සඳහා ලියාපදිංචි වී ඇති සිසු සිසුවියන්ට ඉහත නේවාසිකාගාර වලට පැමිණීමට සූදානම් කර තැබිය හැක.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / අධ්‍යයන හා ශිෂ්‍ය සේවා